ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සහ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වූවන් හැඳින්වීමට බහුලව භාවිත වන "කුඩ්ඩා" යන යෙදුම, මාධ්‍ය තුළ ද දිගින් දිගටම යොදා ගැනීමේ ගැටලුවක් නැතිදැයි Ethics Eye අපි මින් පෙර ද ප්‍රශ්න කර ඇත්තෙමු.

එම ගැටලුව වන්නේ, "කුඩ්ඩා" වැනි යෙදුමක් ඔස්සේ විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සෘණාත්මකව ලේබල්ගත වීමත්, ඉන් ඇතිවන ගර්හාව සහ කොන් කිරීම ඔස්සේ ඔවුන්ට පුනරුත්ථාපනයකින් පසුව හෝ නැවත සමාජයට එක් වීමට ඇති ඉඩ අවහිර වීමත් නොවේදැයි පාඨක අප ඇසිය යුතු වේ.

2022 ජූලි මස සිට දෙසැම්බර් මාසය දක්වා සහ, 2023 ජනවාරි මස සිට ජූලි මාසය දක්වා, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සහ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වූවන් හැඳින්වීමට, "කුඩ්ඩා" යන වචනය තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ යොදාගන ඇති ප්‍රමාණය මෙසේ ප්‍රස්තාර ගත කොට දැක්විය හැක.

